# චිත්ත හා මනස

භංගවන්නේ ඉපදුණු චිත්තය නොවෙය යන්න ඉතා වැදගත් ය. අපට මනස පිළිබඳ ප්‍රවාදය ගොඩනැගීමේ දී මේ කරුණ ඉතා වැදගත් වෙයි. මෙයින් කියැවෙන්නේ චිත්තයක් ඉපදී නැතිවීමට සුළු හෝ කාලයක් ගතවන බවත් ඒ අතර චිත්තය වෙනස්වන බවත් ය. චිත්තය වෙනස්වන්නේය යන්නෙන් අදහස්කරන්නේ කුමක් ද? උත්පාද ඨිති භංග යනුවෙන් කියැවෙන තැන ඨිති යන්නට සම්මුති වශයෙන් ගත්කල පැවතීමක් හා වෙනස්වීමක් අඩංගු බවක් අවශ්‍ය නම් කිව හැකි ය. එහෙත් ගැටළුව වන්නේ වෙනස්වීම යනු කුමක්දැයි තේරුම් ගැනීම ය.

වෙනස්වීම පිටුපස යම් වස්තුවක් වෙයි ද? අපි පුටුව වෙනස්වන්නේ යැයි කියමු. ඉන් කියැවෙන්නේ පුටුව නමින් යමක් තිබෙන බවත් ඒ වෙනස්වන බවත් ද? වෙනස්වන යමක් ගැන අපට කතාකළ හැකි ද? පුටුව දිරාපත් වී යැයි සිතමු. එවිට ඇසිය හැක්කේ දිරාපත්වීම පිටුපස පුටුවේ යම් ධර්මතාවක් වේද යන්න ය. එසේ නම් ඒ ධර්මතාව වෙනස් නොවන්නේ ද? ධර්මතාව වෙනස් නොවන්නේ නම්, වෙනත් අයුරකින් කියන්නේ නම් පුටුවෙහි වෙනස් නොවන යම් ධර්මතාවක් වේ නම්, එයින් අදහස්වන්නේ පුටුවෙහි ධර්මාත්මයක් ඇති බව ය. එය අප නිතර කතාබහ කරන ජීවාත්මය සමග සන්සන්දනය කරන්නේ කෙසේ ද? වෙනස් නොවන ජීවාත්මයක් නැත යන්න ථෙරවාදීන්ගේ මතය වෙයි. ථෙරවාදීන්ට අනුව වෙනස් නොවන ධර්මාත්මයක් හෝ තිබිය නො හැකි ය.

ථෙරවාදීන් ආත්මවාදීන් නොවන්නේ ඔවුන් ජීවාත්මයක් නැතැයි කියන නිසා පමණක් නොව ඔවුන් ධර්මාත්මයක් ද නැතැයි කියන බැවිනි. ඇතැම් බොරු පණ්ඩිතයෝ ආත්මයක් ඇත්තේ ද නැත නැත්තේ ද නැත ආදී වශයෙන් කියති. එහෙත් මෙය වැරදි ය. පැහැදිලිව ම ආත්මයක් නැතැයි ථෙරවාදීහු කියති. ඇතැමුන්ට අනුව අපට අනාත්මවාදීන් ද විය නො හැකි ය. අනාත්මයක් ගැන කියන විට ආත්මයක් ඇතැයි යන්න ද ගම්‍ය වන බව ඔවුහු කියති. ආත්මයක් නැතිව අනාත්මයක් ගැන කිව නොහැකි ය යන්න මොවුන්ගේ තර්කයෙහි සාරය වෙයි. මෙය වැරදි තර්කයකි. අපට අවශ්‍ය වන්නේ ඇතැමුන් (ආත්මවාදීන්) ආත්මයක් යනුවෙන් හඳුන්වන දෙය නැතැයි කීම ය.

අපි ප්‍රශ්නය මෙසේ අසමු. ආත්මයක් තිබේ ද? ඒ ඉතා කෙටි ප්‍රශ්නයකි. එයට පිළිතුර නැත යන්න මිස ඇත්තේ ද නැත, නැත්තේ ද නැත නො වෙයි. ඇතැම් ප්‍රශ්නවලට ඒ ආකාරයේ පිළිතුරු දීමට සිදුවෙයි. උදාහරණයක් ලෙස ගතහොත් පරලොව යන්නේ කවු ද යන්න ප්‍රශ්නයට පිළිතුර තමාත් නොව අන් අයකුත් නොවේය යන්න ය. ඒ පිළිතුර දීමට සිදුවන්නේ ම පරලොව යන අයකු, එනම් පුද්ගලයකු හෝ සත්ත්වයකු නැති වීම ය. වෙනත් වචනවලින් කියන්නේ නම් ආත්මයක් නොමැති වීම ය. ආත්මයක් ඇතාතේ ද නැත, නැත්තේ ද නැත යන ස්ථාවරයේ පිහිටා පරලොව යන්නේ කවු ද යන ප්‍රශ්නයට දෙන පිළිතුර කුමක් ද?

බුදුන් වහන්සේ ඇතැම් ප්‍රශ්නවලට ඉතා පැහැදිලි ඒකාංශ පිළිතුරු දුන්සේක. ප්‍රශ්නයකට එක් පිළිතුරක් පමණක් පැහැදිලි ව ලබාදීම බෞද්ධ ක්‍රමයට පටහැණි නො වෙයි. සමස්ත බුදු දහමෙහි ම මූලික ඉගැන්වීම වනුයේ ආත්මයක් නැත යන්න ය. බුදු දහම අනෙක් දැනුම්වලින් ප්‍රධාන වශයෙන් ම වෙනස් වන්නේ මේ කරුණෙහි දී ය. එහි දී ඉතා පැහැදිලි ව කිවයුතු දෙය ප්‍රකාශකිරීමට මැළි නොවිය යුතු ය. බොරු පණ්ඩිතකම්වලින් සිදුවන්නේ බුදු දහමෙහි වැදගත්කම නැතිකිරීම ය.

චිත්තයක් යනුවෙන් හෝ ධර්මයක් ඇත් ද යන්න අපේ මූලික ප්‍රශ්නය වෙයි. භංගවන්නේ ඉපදුණු චිත්තය නොවේ යැයි බුදුන් වහන්සේ දෙසූහ. ඉන් අදහස්වන්නේ ඒ වෙනස්වීම පිටුපස යමක් ඇති බවත් ඒ ඉපදී නැතිවූ බවත් නො වෙයි. එසේ වෙනස්වීම පිටුපස යමක් ඇතැයි ගත්තේ නම් එවිට ඒ පිටුපස ඇති දෙය ධර්මාත්මයක් වෙයි. එසේ නම් භංගවන්නේ ඉපදුණු චිත්තය නොවෙය යන්නෙහි අර්ථය කුමක් ද? මෙය මනසෙහි සීමාකාරී බව පිළිබඳ ගැටළුවක් වෙයි.

© Prof. Nalin De Silva

අප බොහෝ වතාවක් කලින් ද කියා ඇති පරිදි මනසට ඉතා කුඩා දෙයක්, ධර්මතාවක්, හෝ අල්ලාගැනීමට සිදුවෙයි. අපට ආත්මය යන සංකල්පය අවශ්‍ය වන්නේ මනසෙහි මේ නොසියුම් බව හේතුවෙන් ය. සංකල්පීය වශයෙන් ලෝකය, එනම් ලෝකය යන ව්‍යවහාරය, ශූන්‍යය ලෙස ගැනීමට මනස අසමත් වෙයි. එහි ප්‍රතිඵලය වන්නේ ඉතා සුළු කාලයක් හෝ පවතින්නේ යැයි සිතන ධර්ම ඇතැයි ගැනීමට මනස පෙළඹීම ය. මනසට ගතහැකි කුඩාම කාල අන්තරයක් වෙයි. ඒ කාල අන්තරයෙහි පවත්නා යමක් ඇතැයි සිතීමට මනස පෙළඹෙයි. මේ කුඩාම කාල අන්තරයෙහි පවතින ධර්මතාව ලෙස මනස විසින් ගනු ලබන්නේ චිත්තය ය. චිත්තයට වඩා කුඩා ධර්මතාවක් මනසට නොගත හැකි ය. ඇතැම්විට චිත්තය පරමාර්ථ ධර්මයක් ලෙස කියැවෙන්නේ එබැවින් ය. මනසට සාපේක්ෂව ගතහැකි කුඩාම යන අර්ථයෙන් පරමාර්ථ යන්න යෙදෙන බව කලින් සඳහන් නම කරනලද බෝධි හිමියන්ගේ මතය වෙයි.

ඉහත කී අර්ථයෙන් පවත්නා ධර්මතාවක් ලෙස චිත්තය යන්න ගනිමු. ඉපදුණු චිත්තයක් භංග වීමට පෙර යම් වෙනසකට භාජනය වෙයි. චිත්තයක තොරතුරු වෙයි. චිත්තය ඉප දී නැති වීමේ දී මේ තොරතුරුවලින් බිඳක් නැති කරගෙන හෝ නැතිව හෝ අළුතින් තොරතුරු බිඳක් එකතු කර ගනියි. භංගවන්නේ ඉපදුණු චිත්තය නොවේය යන්න මත මේ අදහස ගොඩනැගෙයි. ඉපදුණු චිත්තය භංගවීමට පෙර එහි ඇති තොරතුරු සම්බන්ධයෙන් වෙනසකට භාජනය වෙයි.

චිත්තයක් නැති වන්නේ තවත් චිත්තයක් ඇති කරමිනි. මේ චිත්ත අතර පරතරයක් නැත. මෙය වැදගත් වෙයි. ඉන් කියැවෙන්නේ චිත්තයක් නැති කුඩා හෝ කාලයක් නොමැති බව ය. කලින් චිත්තය නැති වීමත් සමග අළුත් චිත්තය පැන නගියි. මෙය අනන්තරපච්චය හා සමනන්තරපච්චය ලෙස පට්ඨානයෙහි දැක්වෙයි. අපේ ආකෘතිය අනුව නැතිවන චිත්තය අනන්තරවච්චයෙන් ඇතිවන චිත්තයට ඒ සතු සියළු තොරතුරු ලබා දෙයි. දැන් අළුත් චිත්තය පෙර මෙන් ම තොරතුරු බිඳක් නැතිකර හෝ නැතිව හෝ තොරතුරු බිඳක් එකතු කර ඒ සම්ප්‍රයුක්ත තොරතුරු ඊළඟ චිත්තයට ලබා දී නැති වෙයි. (මෙවැනි අදහසක් මියන්මාර සම්ප්‍රදායෙහි ද ඇති බව විශ්වාස කළ හැකි ය. එහෙත් ඒ අදහස පැහැදිලිව දැනගැනීමට නො හැකි විය.) ඇති වී නැතිවන චිත්ත සියල්ල විසින් චිත්ත පරම්පරාවක් ඇති කෙරෙයි.

ඇතිවන නැතිවන  චිත්ත පරම්පරාව තොරතුරු යම් ප්‍රමාණයක් රඳවා ගනියි. චිත්තයක ඇති තොරතුරුවලින් විශාල ප්‍රමාණයක් අනුගාමී චිත්තයට ලැබෙන්නේ යැයි උපකල්පනය කෙරෙයි. චිත්ත පරම්පරාව විසින් ඒ තොරතුරු එසේ රඳවාගෙන සිටිනු ලැබීම හේතුවෙන් මතකයක් පිළිබඳ හැඟීමක් ගෙන දෙයි. මෙහි දී කිවයුතු වන්නේ මතකයක් ඇත්තේ තොරතුරු පිළිබඳව බව ය. පරිගණකයේ මතකය ගැන ද අප කතා කිරීමට පෙළඹෙන්නේ තොරතුරු ඇසුරින් ය. කෙසේවෙතත් මෙහි දී සඳහන් කරන මතකය බටහිර විද්‍යාවේ සඳහන් මතකය හෝ සාමාන්‍ය ව්‍යවහාරයේ කතා කෙරෙන මතකය හෝ නොවේ. මෙහි සඳහන් මතකය හා මනස ඇත්තේ මොළය හා හදවත ඇසුරු කරමින් මිස මොළයේ කාර්යයක් ලෙස නොවේ. මොළයේ ආබාධ නිසා ඇතැම් විට අප සාමාන්‍යයෙන් කතාකරන මතකය නැති වී ගිය හැකි නමුදු මෙහි සඳහන් මතකය චිත්තය විසින් නැති කර නොගන්නා ලද්දේ නම් නැති නොවෙයි. මෙහි සඳහන් මතකය ඇතැම්විට සාමාන්‍ය ව්‍යවහාරයේ මතකය බවට මොළය ආධාරයෙන් පත්වෙයි. එසේ පත්කළ නොහැකි වුව ද මෙහි සඳහන් මතකය චිත්ත පරම්පරාව ඔස්සේ පවතියි.

කලින් චිත්තයේ හා ඊට පෙර චිත්තවල තොරතුරු විසින් ඇති කෙරෙන මතකයක් ඇති බැවින් ඒ මතකය සත්වයකු, පුද්ගලයකු ඇතැයි යන සංකල්පය ඇති කරයි. එනම් මනසක් නිර්මාණය කරයි. නැත්නම් මනසක් නිර්මාණය වෙයි. මින් කියැවෙන්නේ මනස යනු මනසේ ම නිර්මාණයක් බව ය! (අපට සිතෙයි. එමෙන් ම අපි සිතමු.වත්මන් ඉංගිරිසියෙහි සිතෙන බව හා සිතන බව පැවසිය හැක්කේ ඉතා අමාරුවෙනි. පැරණි ඉංගිරිසියෙහි එවැනි ව්‍යවහාරයක් සඳහා වචන තිබිණි යැයි එක් මහතකු මට දන්වා එවා තිබුණි.) මනස යනු ඇතිවන නැතිවන චිත්ත පරම්පරාවේ තොරතුරු, සන්තතියක් ලෙස වැරදියට තේරුම් ගැනීමෙන් නිර්මාණය වන්නකි. එසේ තේරුම් ගන්නේ ද මනසම ය. මනස නිර්මාණය වන්නේ ද එසේ තේරුම් ගැනීමෙනි. මේ චක්‍රීයභාවයෙන් ගැළවීමක් නැත. එපමණක් නොවේ. මනස ආකෘතිය නිර්මාණය කෙරෙන්නේ චිත්ත ඇසුරෙනි. චිත්ත යනු මනසේ නිර්මාණ වෙයි. එහි ද චක්‍රීය

© Prof. Nalin De Silva

භාවයක් වෙයි. මේ සියල්ල අනිත්‍ය අනාත්ම අනවබෝධයෙන් සිදු වන දෑ ය. මෙයට වඩා දුකක් වේ ද? අනිත්‍ය දුක්ඛ අනාත්ම අවබෝධයේ දී පිරිනිවන් පානා තෙක් චිත්ත පරම්පරාව ඇති වෙමින් නැති වෙමින් පැවතුණ ද, පිරිනිවන් පෑමෙන් පසුව අළුත් චිත්තයක් ඇති නොවෙයි. සෝපාදිසේස හා නිරූපාදිසේස නිවන් අවබෝධය එලෙසින් තේරුම් ගත හැකි ය.

මනස යනු ද භ්‍රාන්තියකි. ද්‍රව්‍ය වශයෙන් මනස විසින් ගනු ලැබෙන්නේ භ්‍රාන්ති ය. ද්‍රව්‍ය මනසේ නිර්මානයක් වෙයි. එහෙත් ඉන් කියැවෙන්නේ මනස පවතින බවක් නො වෙයි. මනස ද මනසෙහි භ්‍රාන්තියක් වෙයි. මනස ද මනස විසින් නිර්මානය කෙරෙයි. මනස නිර්මානය වන්නේ ඇතිවෙන නැතිවෙන චිත්ත පරම්පරාවක් හේතුවෙනි. ඇතිවන නැතිවන චිත්ත පරම්පරාවේ යම් තොරතුරු රාශියක් රැඳෙයි. මේ තොරතුරු මතකයක්, පුද්ගලයකු, මනසක් ආදී වශයෙන් ගැනීමට මනස පෙළඹෙයි. එසේ පෙළඹීම ම මනසේ කාර්යය වෙයි.

එහෙත් අප එකක් අමතක නොකළ යුතු ය. මනස තොරතුරු රැස්කරගන්නා චිත්ත පරම්පරාවක ප්‍රතිඵලයක් ය යන්නෙන් කියැවෙන්නේ එවැනි චිත්ත පරම්පරාවක් මනසෙන් ස්වායත්ත ව, පරිබාහිර ව පවතින බවක් නො වෙයි. ඒ මනස පිළිබඳ ව වූ චිත්ත පරම්පරාව යන ප්‍රවාදය ගොඩ නගා ඇත්තේ ද මනස විසින් ම ය. මනස විසින් නිර්මානය කෙරෙන චිත්තය යන සංකල්පය මනස පිළිබඳ ප්‍රවාදයක් ගොඩනගාගැනීමෙහි දී යොදාගෙන තිබේ. මනස විසින් පුටුව යනුවෙන් සංකල්පයක් නිර්මානය කෙරෙන පරිදි ම ඒ විසින් චිත්තය යන සංකල්පය නිර්මානය කෙරෙයි. චිත්තය යන්න මනසට ගතහැකි කුඩාම කාල අන්තරයෙහි ඇති ධර්මතාවය ය. කාලය යන්න ද මනසේ නිර්මානයක් වන බැවින් (ථෙරවාදී සම්ප්‍රදායයෙහි කාලය යනු පඤ්ඤත්තියක් බව අවධාරණය කළ යුතු වෙයි.) චිත්තය යනු අඩුම කාල අන්තරයෙහි දී නිර්මානය කෙරෙන ධර්මතාව යන්නෙන් මනසෙන් තොරව කාලය යනුවෙන් දෙයක් ඇතැයි නොසිතිය යුතු ය. කාලය, මනස, මතකය, ආත්මය එකිනෙකට සම්බන්ධ වූ සංකල්ප වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva